# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 14 දරන

# විනිමය පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය.

## ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 14 දරන විනිමය පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 84/71.

**විනිමය පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 14 දරන විනිමය පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

**2.** විනිමය පාලන පනතෙහි V වන කොටසට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් කොටස ඇතුළත් කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලබන අතර එය එම පනතෙහි Vඅ වන කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය :— *(423 වන අධිකාරය සංශෝධනය කිරීම.)*

‘Vඅ වන කොටස

**මේ පනත යටතේ වැරදි විමර්ශනය කිරීම සහ සාක්ෂි පිළිබඳ විශේෂ විධිවිධාන**

*(පොලිස් නිලධරයන්ගේ විශේෂ බලතල.)*

30අ. මේ පනත යටතේ වූ ද රුපියල් දස දහසකට වැඩි මුදලක් හෝ මුළු ගණන රුපියල් දස දහසකට වැඩි වූ මුදලක් සම්බන්ධ වූ ද වරදක් හෝ වැරදි මාලාවක් කර ඇතැයි සැක කිරීමට පොලිස්පතිට හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට හෝ මේ වගන්තියේ කාර්යයන් සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකුට යුක්තිසහගත හේතු ඇති අවස්ථාවක, මේ වගන්තියෙහි නිශ්චිතව සඳහන් ක්‍රියා අතුරින් යම් ක්‍රියාවක් හෝ ඒ ක්‍රියා සියල්ලම හෝ මහෙස්ත්‍රාත්වරයකුගේ බලය කලින් නොලබා සහ වරෙන්තු බලපත්‍රයක් නොමැතිව කිරීමට ඔහු විසින් පොලිස් නිලධරයකුට බලය පැවරිය හැකි ය. ඒ ක්‍රියා මෙසේ ය :—

(1) එවැනි යම් වරදකට හෝ එවැනි වැරදි මාලාවකට සම්බන්ධ වූ හෝ එසේ සම්බන්ධ වී ඇති බවට යුක්ති සහගත පැමිණිල්ලක් විරුද්ධ ව කරනු ලැබ ඇති හෝ විශ්වාස කටයුතු තොරතුරු ලැබී ඇති හෝ යුක්ති සහගත සැකයක් ඇති (මෙහි මින් මතු “සැක කළ තැනැත්තා” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු අත්අඩංගුවට ගෙන සිර භාරයට ගැනීම ;

1—කේ 17142—10,114 (72/2)

(2) සැක කළ යම් තැනැත්තකුගේ හෝ එවැනි යම් වරදකට අදාළ කරුණු කිසිවක් ගැන දැනීමක් ඇති බව සලකනු ලබන අන් කිසි තැනැත්තකුගේ යම් ප්‍රකාශයක් සටහන් කර ගැනීම;

(3) යම් සැක කළ තැනැත්තකුගේ අත්සන හා ආදර්ශ අත් අකුරු ලබා ගැනීම;

(4) සැක කළ යම් තැනැත්තකුගේ ඡායාරූප ගැනීම, මිමි ගැනීම, ඇඟිලි සලකුණු ගැනීම හෝ ඔහු අන්‍යාකාරයෙන් හඳුනා ගැනීම සඳහා යුක්ති සහගත ව අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා කිරීම;

(5) සැක කළ තැනැත්තකු සෝදිසි කිරීම හෝ ඒ තැනැත්තා පදිංචි නිවසට හෝ වැඩ කරන ස්ථානයට අවශ්‍ය විය හැකි සහාය ද ඇති ව ඇතුළු වී එය සෝදිසි කිරීම;

(6) එවැනි යම් වරදකට අදාළ හෝ සම්බන්ධ හෝ අදාළ යැයි හෝ සම්බන්ධ යැයි සලකනු ලබන යම් ස්ථානයකට, ගොඩ නැගිල්ලකට, වාහනයකට හෝ ජල යාත්‍රාවකට අවශ්‍ය විය හැකි සහාය ද ඇති ව ඇතුළු වී එය සෝදිසි කිරීම; සහ

(7) වෙනත් යම් ලිඛිත හෝ අන් ආකාරයකින් වූ නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද යම් වරදක් විමර්ශනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන, යම් විදුලි පණිවුඩයක්, (මෙරට හෝ විදේශීය) යම් තැපැල් ලේඛනයක් ඇතුළු කවරාකාරයේ වූ හෝ යම් චංචල දේපළක් පරීක්ෂා කිරීම හා සන්තකයට ගැනීම, සහ යම් බැංකුවක පොත් හෝ ලේඛන කිසිවක සහතික පිටපත් හෝ ඡායාස්ථිති පිටපත් ලබාගැනීම.

අත්අඩංගුවට ගත් තැනැත්තන් සිරභාරයේ තබා ගැනීම.

30ආ. (1) ඉහත අන්තිමට සඳහන් වගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලැබූ යම් සැක කළ තැනැත්තකු පැය විසිහතරක් ඇතුළත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණ විය යුතු අතර මේ පනත යටතේ වූ එවැනි යම් වරදක් පිළිබඳ ව ඒ තැනැත්තාට සම්බන්ධ විමර්ශන සම්පූර්ණ කර නොමැති බවට සහකාර පොලිස් අධිකාරි තනතුරට නො අඩු තත්ත්වයක පොලිස් නිලධරයකු විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත්

කරනු ලැබුවහොත් ඒ තැනැත්තා මාසයක කාල යක් පිස්කල්ගේ භාරයේ තබා ගත යුතු බවට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය ; තව ද, ඒ කාලසීමාව අවසානයේ දී එවැනි ම ඉල්ලීමක් මහෙස්ත්‍රාත්වරයා වෙත කරනු ලැබුව හොත් ඒ තැනැත්තා දෙවන මාසයක් සඳහා පිස්කල්ගේ භාරයෙහි තබා ගත යුතු යැයි ඔහු විසින් නියම කළ හැකි ය.

(2) සැක කළ තැනැත්තා අත්අඩංගුවට ගනු ලැබූ දින සිට දෙවන මාසය ගත වීමට පෙර, කරන ලදැයි කියනු ලබන වරද පිළිබඳ විමර්ශන සම්පූර්ණ කිරීම සඳහා ඒ තැනැත්තා තවදුරටත් සිර භාරයේ තබා ගත යුතු යයි නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එවිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභිමතය පරිදි ඒ තැනැත්තා මාස තුනකට නො වැඩි කාලයක් පිස්කල් භාරයේ රඳවා ගන්නා ලෙස ඒ තැනැත්තා සිර භාරයේ සිටින පරිපාලන දිස්ත්‍රික්කයේ පිස්කල් වෙත යැවෙන වරෙන්තු බලපත්‍රයක් මගින් නියම කළ හැකි ය. මේ උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් ඉල්ලීම් එකකට වැඩි ගණනක් ඉදිරිපත් කළ හැකි නමුදු මේ උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කළ හැකි රඳවා තබා ගැනීමේ සම්පූර්ණ කාලය මාස තුනකට වැඩි නො විය යුතු ය.

(3) දෙවන මාසය ගත වීමට පෙර නීතිපතිවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් කර නැතහොත් හෝ එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, සැක කළ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණ විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයා විසින් සිය අභිමතය පරිදි ඒ තැනැත්තා නිදහස් කළ යුතු යයි හෝ ඇප පිට මුදා හැරිය යුතු යයි නියම කළ හැකි ය.

(4) සැක කළ තැනැත්තකු මේ වගන්තිය යටතේ පිස්කල්ගේ නීත්‍යනුකූල භාරයෙහි සිටින කාල සීමාව තුළ, ඔහු විසින් කරන ලදැයි කියනු ලබන වරද විමර්ශනය කරන යම් පොලිස් නිලධරයකුට ඒ විමර්ශනය පවත්වා ගෙන යෑමේ කාර්යය සඳහා යුක්තිසහගත කාලවේලාවල දී ඒ තැනැත්තා මුණ ගැසීමේ අයිතිවාසිකම තිබිය යුතු අතර විමර්ශනයේ කාර්යයන් සඳහා ඒ තැනැත්තා තැනකින් තැන

කට ගෙනයෑම අවශ්‍ය යැයි සලකනු ලබතහොත් ඒ පොලිස් නිලධරයා විසින් ඔහු එසේ තැනකින් තැනකට ගෙන යා හැකි ය.

(5) සැක කළ තැනැත්තකු මේ වගන්තිය යටතේ පිස්කල්ගේ නිත්‍යානුකූල භාරයෙහි සිටින කාලසීමාව තුළ ඒ තැනැත්තා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ලියවිල්ලෙන් බලය පවරනු ලැබිය හැකි ස්ථානයක රඳවා තබා ගත යුතු ය. ඒ ස්ථානය බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවන ලද බන්ධනාගාරයක් වුව ද නො වුව ද ඒ තැනැත්තා භාර ගැනීම හා රඳවා තබා ගැනීම ඒ ස්ථානය භාරව සිටින තැනැත්තාගේ හෝ නිලධරයාගේ යුතුකම විය යුතු අතර බන්ධනාගාර ආඥාපනතෙහි විධිවිධාන හා ඒ යටතේ සාදන ලද රීති ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුව ද අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒ ස්ථානය භාරව සිටින තැනැත්තා හෝ නිලධරයා වෙත නිකුත් කරනු ලබන නියමයක් මගින් ඒ නියමයෙහි දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට හෝ වෙනස් කිරීම්වලට යටත් ව බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන අතුරෙන් කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද රීති අතුරෙන් කිසිවක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ නො විය යුතු යයි කලින් කල නියම කළ හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කිරීම අවශ්‍ය නො විය යුතු අතර ඒ අනුව ඒ නියමය අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් එයට අත්සන තැබූ විට වලංගු විය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි විමර්ශනය කිරීම සඳහා හෝ ඒ වැරදි සම්බන්ධයෙන් නඩු විභාග කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි සිටීම අවශ්‍ය යයි සලකනු ලබන තැනැත්තන්ගේ ගමන් බලපත්‍ර ආදිය තහනම් කිරීම.

30ඈ. මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ යම් විමර්ශනයක කාර්යය සඳහා හෝ ඒ වරද සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි පවතින යම් නඩු විභාගයක කාර්යය සඳහා (ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් දරන්නකු වූ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි සිටීම අවශ්‍ය බව පොලිස්පති හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ මේ වගන්තියේ කාර්යයන් සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ අදහස් කරන අවස්ථාවක එකී නිලධරයකු විසින් ඒ බව ආගමන හා විගමන පාලක වෙත දැන්විය යුතු ය. එවිට ඔහුගේ ගමන් බලපත්‍රය හා සෙසු ගමන් ලේඛන තහනම් කිරීමට සැලැස්වීම පාලකගේ යුතුකම විය යුතු ය.

**මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් චූදිත හෝ යුක්ති සහගතව සැක කරනු ලැබූ තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිට වී යෑම වැළැක් වීමට ගත හැකි පියවර.**

30ඇ. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චූදිත හෝ මේ පනත යටතේ වූ යම් වරදක් කරන ලද බවට යුක්තිසහගතව සැක කරනු ලැබූ ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් දරන්නකු නො වූ යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් පිට වී යාමට ඉඩ ඇති බව පොලිස්පති හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ මේ වගන්තියේ කාර්යයන් සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ අදහස් කරනහොත් ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා නොපමාව අත් අඩංගුවට ගැනීමට හා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණ වීමට සැලැස්විය හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ වරද පිළිබඳ නඩු විභාගයට ඉදිරිපත් වන බවට ඇපකරුවන් එක් කෙනකු හෝ වැඩි ගණනක් ඇතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය; නැතහොත් නඩු විභාගයට භාජන කරනු ලැබිය හැකි වන තුරු ඔහු සිරභාරයෙහි තැබිය යුතු යයි නියම කළ හැකි ය.

**මේ පනත යටතේ වූ වැරදි වලට සම්බන්ධ මුදල් තැන්පත් කර ඇති බැංකු ගිණුම්වල ගණුදෙනු කටයුතු පාලනය කිරීම.**

30ඉ. (1) මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ විමර්ශනයක් කර ගෙන යෑමේ දී ඒ වරදට සම්බන්ධ මුදල් යම් බැංකුවක ගිණුමක තැන්පත් කර ඇති බව සහකාර පොලිස් අධිකාරී තනතුරට නො අඩු තත්ත්වයක පොලිස් නිලධරයකුට පෙනී ගියහොත් ඔහු විසින් ඒ බව විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත දැනුම් දිය හැකි අතර ඒ ගිණුමෙහි ගණුදෙනු කටයුතු කිරීමට කිසිදු තැනැත්තකුට ඉඩ නො දෙන ලෙස හෝ සිය විධානයෙහි දැක්වෙන නියමයනට හා කොන්දේසි වලට අනුකූල ව පමණක් ඒ ගිණුමෙහි ගණුදෙනු කටයුතු කිරීමට යම් තැනැත්තකුට ඉඩ දෙන ලෙස ඒ ගිණුම පවත්වා ගෙන යන බැංකුවේ කළමනාකරුට ඒ ප්‍රධානයා විසින් ලියවිල්ලකින් විධාන කළ හැකි ය.

(2) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් විධානයක් සතියක කාලය ඉක්මවා නොකඩව වලංගු විය යුතු යයි වැඩිදුරටත් වූ ලිඛිත විධානයක් මගින් ඒ ප්‍රධානයා විසින් අණ කළ හොත් මිස ඒ විධානය කරන ලද දිනයේ සිට සතියක කාලයක් එය වලංගුව පැවතිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ යම් විධානයක් ලබන යම් බැංකුවක කළමනාකරු විසින් ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටවී යාමට සූදානමින් සිටින තැනැත්තන් විසින් මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රකාශ.

30ඊ. (1) මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ විමර්ශනයක් පවත්වා ගෙන යනු ලබන අතර ශ්‍රී ලංකාවෙන් පිට වී යාමට සූදානම් ව සිටින තැනැත්තකුට, සැක කළ තැනැත්තා හෝ තැනැත්තන් පැමිණ සිටියදී දිසා විනිශ්චයකාර වරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ඒ වරද සම්බන්ධයෙන් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් පිට ප්‍රකාශනයක් කිරීමට නියම කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ ප්‍රකාශය කරනු ලබන්නේ යම් දිසා විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ද ඒ දිසා විනිශ්චය කාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්—

(අ) ඒ ප්‍රකාශය සටහන් කර ගැනීම ;

(ආ) සැක කළ තැනැත්තා හෝ තැනැත්තන් ඉදිරිපිට ඒ ප්‍රකාශය එය කරන තැනැත්තාට නැවත කියවීම ;

(ඇ) සැක කළ තැනැත්තාට හෝ තැනැත්තන්ට එම ප්‍රකාශය පැහැදිලි කර දීම ;

(ඈ) එම ප්‍රකාශය සම්බන්ධයෙන් ඇසීමට ප්‍රශ්න කිසිවක් ඇතොත් ප්‍රකාශය කරන තැනැත්තාගෙන් ඒ ප්‍රශ්න ඇසීමට සැක කරනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ට සම්පූර්ණ අවස්ථාවක් ලබා දීම ;

(ඉ) ප්‍රකාශය කරන තැනැත්තා විසින් දෙන ලද පිළිතුරු සමග ඒ ප්‍රශ්න සටහන් කර ගැනීම ;

(ඊ) ප්‍රකාශය කරන තැනැත්තාට සටහන් කර ගන්නා ලද ඒ ප්‍රකාශය අග ඔහුගේ අත්සන තබන ලෙස නියම කිරීම ; සහ

(උ) මේ වගන්තියෙහි නියමයන් අනුව ක්‍රියා කරන ලද නම් ඒ බව සහතික කිරීම

කළ යුතු ය.

(3) යම් දිසා විනිශ්චයකාරවරයකුට හෝ මහෙස්ත්‍රාත්වරයකුට—

(අ) මේ වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කිරීමට අදහස් කරන යම් තැනැත්තකු දිවුරුම් ආඥාපනත යටතේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් බලය දී ඇති ආකාරයකට දිවුරවීමට හෝ ඔහුගෙන් ප්‍රතිඥාවක් ගැනීමට ; සහ

(ආ) ඉන් පසු (2) වන උපවගන්තියෙහි විධි විධාන යටතේ කටයුතු කිරීමට

මෙයින් බලය දී නියම කරනු ලැබේ.

(4) මේ වගන්තිය යටතේ සහතික කරනු ලැබ ඇතැයි සැලකෙන ප්‍රකාශය අධිකරණයට ඉදිරිපත් කොට සැක කළ තැනැත්තාට හෝ තැනැත්තන්ට විරුද්ධව සාක්ෂි වශයෙන් ගෙනහැර පෑ හැකි අතර එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි පිළිබඳ නඩු විභාගවලට අදාළ වන සාක්ෂි පිළිබඳ විශේෂ විධිවිධාන.

30උ. මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ යම් නඩු විභාගයක දී පහත සඳහන් සාක්ෂි විධි විධාන අදාළ විය යුතු ය:—

(1) යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් අපරාධෝච්චාරණයක් වුවත් නො වුවත් ඒ ප්‍රකාශය කරනු ලැබූ අවස්ථාවේ දී ඒ තැනැත්තා පොලිස් නිලධරයකු හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ හෝ රේගු දෙපාර්තමේන්තුවේ හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු භාරයෙහි හෝ ඉදිරිපිට සිටියත් නොසිටියත් ඒ ප්‍රකාශය කරන ලද්දේ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ම වුවත් නො වුවත් එය සාක්ෂි ආඥාපනතෙහි 24 වන වගන්තිය යටතේ අනුචිත නොවේ නම් ඒ ප්‍රකාශය ඒ තැනැත්තාට විරුද්ධ ව ඔප්පු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද ඒ ප්‍රකාශය කරන ලද්දේ සහකාර පොලිස් අධිකාරි තනතුරට අඩු තත්ත්වයක පොලිස් නිලධරයකුට නම් ඒ ප්‍රකාශය ඒ තැනැත්තාට විරුද්ධව ඔප්පු කරනු නො ලැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි (1) ඡේදය යටතේ පිළිගත හැකි යම් ප්‍රකාශයක් මේ වගන්තියෙහි (1) ඡේදයෙහි සඳහන් ප්‍රකාශය නො වන සාක්ෂිවලින් වැදගත් කරුණු අතින් තහවුරු වේ නම් හා එසේ නම් පමණක් ඒ ප්‍රකාශය එය කරනු ලබන තැනැත්තා සමග එකට චෝදනා කරනු ලැබූ අන් කිසි තැනැත්තකුට විරුද්ධව ඔප්පු කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (1) ඡේදයෙහි සඳහන් යම් ප්‍රකාශයක් සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ උචිත නො වන

බව ඔප්පු කිරීමේ භාරය එය උචිත නොවන බව කියා සිටින තැනැත්තා කෙරෙහි විය යුතු ය.

(4) වෙනත් යම් ලිඛිත හෝ අන් ආකාරයකින් වූ නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සාක්ෂි ආඥාපනතේ 25, 26 හා 30 වන වගන්තිවල විධිවිධාන අදාළ නො විය යුතු ය.

(5) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චූදිත තැනැත්තකුගේ හෝ ඒ තැනැත්තාගේ අනුයෝජිතයකුගේ හෝ නියෝජිතයකුගේ භාරයෙහි, පාලනයෙහි හෝ සන්තකයෙහි තිබී ලැබුණු යම් ලේඛනයක් අධිකරණය වෙත ඉදිරිපත් කොට ඒ ලේඛනය කළ තැනැත්තා සාක්ෂිකරුවකු වශයෙන් නො කැඳවා ඒ චූදිත තැනැත්තාට විරුද්ධ ව සාක්ෂි වශයෙන් ගෙන හැර දැක්විය හැකි අතර ඒ ලේඛනයෙහි ඇතුළත් කරුණු එහි සඳහන් සිද්ධීන් පිළිබඳ සාක්ෂි විය යුතු ය.

(6) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චූදිත තැනැත්තකු හෝ ඔහුගේ අනුයෝජිතයකු හෝ නියෝජිතයකු විසින් දේශීය ආදායම් කොමසාරිස්වරයාට හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට කරන ලද්දා වූ හා විවාදගිමුඛව ඇති හෝ අදාළ කරුණු කිසිවක් පිළිබඳ අනුමිතියක් හඟවන්නා වූ යම් ප්‍රකාශයක් හෝ ඔහුට සපයන ලද එවැනි යම් තොරතුරක් හෝ ඒ තැනැත්තා විසින් තමාගේ අනුයෝජිතයාට හෝ නියෝජිතයාට සපයන ලද එවැනි යම් තොරතුරක් අදාළ හා පිළිගත හැකි විය යුතු ය.

(7) මේ වගන්තියේ (6) වන උපවගන්තියෙහි සඳහන් යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස හෝ ඒ ප්‍රකාශය හෝ තොරතුර සම්බන්ධයෙන් සාක්ෂි දෙන ලෙස මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ විභාගයක් කරන හෝ නඩු විභාගයක් පවත්වන යම් අධිකරණයක් විසින් නියම කරනු ලැබූ අවස්ථාවක දේශීය ආදායම්

කොමසාරිස්වරයා හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු එසේ ඉදිරිපත් කිරීම හෝ සාක්ෂි දීම කළ යුතු ය.

මේ කොටස යටතේ පොලිස් නිලධරයකුගේ බලතල ඔහුගේ වෙනත් බලතලවලට අතිරේකව විය යුතු බව.

30උඉ. මේ පනතේ මේ කොටස යටතේ පොලිස් නිලධරයකුගේ බලතල අන් කිසි ලිඛිත නීතියක් මගින් ඒ නිලධරයා වෙත පැවරුණු බලතල කිසිවක බලහීන කිරීම් වශයෙන් නොව ඊට අතිරේක ව විය යුතු ය.'.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද, පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.